# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 06 දරන ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** මාර්තු මස **08** වන දින ]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 06 දරන ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 08 වන දින]

එල්. ඩී.— ඕ. අයි.එන්.සී. 01/2005.

## ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියළු පරමාර්ථ සහ කරුණු ඵලදායී ලෙස ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද එම පදනම සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 06 දරන ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සාරානන්ද සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් සාරානන්ද සංවර්ධන පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය භාවිත කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සංස්ථාවේ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරීම කරනු ලැබිය හැකි ය. ශ්‍රී සාරානන්ද සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

2-P L 001516 - 4,250 (2006/10)

(අ) පදනමේ සාමාජිකයන්ගේ ආර්ථික, සාමාජීක හා සංස්කෘතික අවශ්‍යතා සපුරාලීම සහ සුභ සාධක පහසුකම් සැපයීම ;

(ආ) ගංගාරාම මහා විහාරය සංරක්ෂණය සහ එහි ප්‍රතිසංස්කරණය, ශ්‍රී සාරානන්ද පිරිවෙන, දහම්පාසල, ළදරු පාසල, වෘත්තීය පුහුණු අංශය පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කිරීම ; සහ

(ඇ) ගංගාරාම මහා විහාරයේ පැරණි ගොඩනැගිලි වූ විහාර මන්දිරය, තෙමහල් ධර්ම ශාලාව, සීමා මන්දිරය, ආවාස ගෘහය ප්‍රතිසංස්කරණය ද නව අවශ්‍යතාවලට ගැලපෙන පරිදි පරිශ්‍රයේ ගොඩනැගිලි ඉදි කිරීම ද, වන්දනා කරන ස්ථාන වැඩි දියුණු කිරීම ද, භූමිය සංරක්ෂණය, අලංකරණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම් භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන පස් දෙනකුගෙන් යුත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත විධායක සභාවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට අනුකූලව පරිපාලනය හා කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවතිත පදනමේ විධායක සභාවේ ධුර දරමින් සිටි තැනැත්තන්ගෙන් සංස්ථාවේ පළමුවන විධායක සභාව සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය:—

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ;

(ඈ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම සහ ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ; සහ

(ඊ) සංස්ථාවට අයත් මුදල් විධායක කමිටුව විසින් නියම කරනු ලබන යම් සුරැකුම්පත්වල අයෝජනය කිරීම.

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

**6**. (1) සංස්ථාවේ අරමුදල — සංස්ථාවේ අරමුදල.

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බැරට පැවතියා වූ ද එදින සිට සංගමයට පවරනු ලැබිය යුතු වූ සියලු මුදල් වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසුව සංස්ථාවට ලැබෙන මුදල් වලින්,

සමන්විත විය යුතු ය.

(2) සංස්ථාවේ අරමුදලේ බැරට ඇති සියලුම මුදල් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමෙහි ලා දරන ලද වියදම් පියවීම සඳහා සහ එහි පරමාර්ථ සපුරාලීම සඳහා යොදවනු ලැබිය යුතු ය.

**7**. (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් පැමිණ ඡන්දය දෙන එහි යම් මහා සභා රැස්වීමක දී, මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත කාරණා සම්බන්ධයෙන් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) විධායක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, පත් කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ඔවුනගේ ධුර කාලය ;

(ආ) සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, රැස්වීම් පවත්වන වේලාව සහ ස්ථානය නියම කිරීම සහ එවැනි රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යායපත් පිළිබඳව අවසන් තීරණය ගැනීම සහ රැස්වීම්වල ගණපූරණය නිශ්චය කිරීම සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම ;

(ඈ) විධායක කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සපුරාලීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ කවර වුව ද රීතියක් එවැනිව රැස්වීමක දී එවැනි ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ විධායක කමිටුව විසින් සංස්ථාවේ ආදායම් සහ වියදම් පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ විධායක කමිටුව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

සංස්ථාවේ ආදායම සහ දේපළ යෙදවිය යුතු ආකාරය.

9. කවර ආකාරයකින් හෝ ලැබුණා වූ සංස්ථාවේ ආදායම සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි හුදෙක් සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදා ගනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක්, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

10. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, ඒ දිනයේ දී පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

11. සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, ලේකම්වරයා සහ සභාපතිවරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද ඔවුන් පැමිණ සිට බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කල යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.